# සිංහල

## 5 ශ්‍රේණිය




Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

# 10 පාඩම

## ඔහු / ඔවුහු යොදා වැකි ලියමු.

### පියවර 1

- මේ තියෙන්නේ ඔයාලා වගේ ම පුංචි ළමයෙක් එයාගේ මාමා ගැන ලියපු වැකි කිහිපයක්.

"හොඳයි දැන් ඒ වැකි හොඳින් කියවන්න"

**<u>මගේ මාමා</u>**
මගේ මාමා උසස් අධ්‍යාපනයක් ලැබූ අයෙකි. ඔහු පුස්තකාලයක සේවය කරයි. ඔහු බොහෝ පොත් පත් කියවා දැනුම ලබා ගත්තේය.

### පියවර 2

- දැන් මේ හැම වැකියක ම ඔහු යන පදය ඉවත් කර 'මාමා' යන පදය යොදා නැවත කියවමු.

"ඔයා එහෙම වැකි කියවන කොට ආස හිතෙන්නේ නෑ නේද?"

ඒ නිසා පුතේ, දුවේ, පුරුෂ ලිංග නාම පදයක් වෙනුවට ඔහු යන පදය යෙදුවහොත් වාක්‍යය ලස්සනයි නේද?ඒ වගේම වාක්‍ය යේ අවසාන ක්‍රියාව ඒක වචනයෙන් තියන බව හොඳට මතක තබා ගන්නත් ඕනේ.

අන්තර්ගතය : සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව
සැකසුම : එස්.ඒ.රුවන් ලක්මාල් සමරතුංග - ර/මැටිහක්වල විද්‍යාලය - ඕපනායක

## පියවර 3

- ඒ විතරක් නෙවෙයි,

අපිට ඒ වගේම පුරුෂ ලිංග බහු වචන පදයක් උක්තය ට යෙදෙනවා නම් බහු වචන පදය වෙනුවට 'ඔවුහු' යන පදය යොදන්නත් පුළුවන්.

එවිට වාක්‍යයේ අවසාන ක්‍රියාව බහු වචනයෙන් කියන බව හොඳින් ම මතක තබා ගන්න බලමු.



උදා:- ළමයි වත්තට යති.

ඔවුහු වත්තේ සෙල්ලම් කරති.

## පියවර 4

- අපි දන්නව ඔයා හපනෙක්. ඔයාට වැකි කීපයක් දීලා තියෙනවා. එම වැකි **ඔවුහු** යොදා ලියල බලමු නේද?

1. ගොවියෝ කුඹුරට යති.

   ........................................................................................

2. මල්ලිලා අඹ ගස යටට යති.

   ....................................................................................................

3. වෛද්‍යවරු රෝහල ට පැමිණෙ ති.

   ....................................................................................................

අන්තර්ගතය : සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව

සැකසුම : එස්.ඒ.රුවන් ලක්මාල් සමරතුංග - ර/මැටිහක්වල විද්‍යාලය - ඕපනායක

<u>දැනුම පොතට</u>

- අපේ ගත්කතුවරයෝ

   

ඇස්. මහින්ද හිමි  මාටරීන් වික්‍රමසිංහ මහතා  සිබිල් වෙත්තසිංහ මහත්මිය  මහගම සේකර මහතා

(කට පාඩම් නොකරන්න. දැනුමට පමණයි.)